# G.C.E. ORDINARY LEVEL
# අ.පො.ස. සාමාන්‍ය පෙළ

## STUDENT SEMINAR SERIES - 2017
## ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017

# SCIENCE
# විද්‍යාව

# QUESTION PAPER - I
# ප්‍රශ්න පත්‍රය - I



Powered by

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ඉ-ඉගෙනුම් හා නැණසස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය**

# අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017

## විද්‍යාව - I

| 11 ශ්‍රේණිය | සිංහල මාධ්‍යය | කාලය - පැ 1 |
|---|---|---|

- *සියලුම ප්‍රශ්නවලටඋත්තර සපයන්න.*
- *අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල , දී ඇති (1),(2),(3),(4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තෝරන්න.*
- *ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව ඇසුරින් ,ඔබ තෝරා ගත් වරණයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.*
- *එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ,ඒවා ද පිළිපදින්න.*

1. කාබෝහයිඩ්‍රේට් ,ප්‍රෝටීන, ලිපිඩ හා නියුක්ලෙයික් අම්ලවල අනිවාර්යයෙන්ම අඩංගු මූලද්‍රව්‍ය ඇතුළත් නිවැරදි පිළිතුර කුමක්ද?
   (1) C , H , N (2) C ,H, O (3) C, O , P (4) C ,H ,S

2.රූපයේ දැක්වෙන සත්ත්ව පටකය,



   (1) අපිච්ඡද පටකයකි. (2) සිනිඳු පේශි පටකයකි.
   (3) කංකාල පේශී පටකයකි. (4) ස්නායු පටකයකි.

3.පහත දැක්වෙන භෞතික රාශීන් අතරින් දෛශික රාශිය වන්නේ,
   (1) දුර ය. (2) වේගය ය. (3) ස්කන්ධය ය. (4) බර ය.

4. එදිනෙදා ජීවිතයේදී බහුලව වැදගත්වන විද්‍යුත් චුම්භක වර්ණාවලියට අයත් තරංග වර්ගය වන්නේ,
   (1) X කිරණ ය. (2) අධෝරක්ත කිරණ ය.
   (3) රේඩියෝ තරංග ය. (4) දෘශ්‍ය ආලෝක ය.

5.මූලද්‍රව්‍ය සමස්ථානිකයක
   (1) ඉලෙක්ට්‍රෝන සංඛ්‍යා එකිනෙකට වෙනස් ය. (3) නියුට්‍රෝන සංඛ්‍යා එකිනෙකට වෙනස් ය.
   (2) ප්‍රෝට්‍රෝන සංඛ්‍යා එකිනෙකට වෙනස් ය. (4) ස්කන්ධ ක්‍රමාංක එකිනෙකට වෙනස් ය.

6. සමජාතීය මිශ්‍රණයක් විෂම ජාතීය මිශ්‍රණයකින් වෙනස් වන්නේ, සමජාතීය මිශ්‍රණවල
   (1) සංයුතිය ඒකාකාර වීමයි.
   (2) සංයුතිය ඒකාකාර නොවීමයි.
   (3) භෞතික ලක්ෂණ ඒකාකාරව නොපැවතීමයි.
   (4) ද්‍රාවක අංශු වැඩිපුර පැවතීමයි.

7. ශාක සෛලවල පමණක් අඩංගු ඉන්ද්‍රයිකාව කුමක්ද?
   (1) මයිටකොන්ඩ්‍රියා 2. හරිතලව (3) න්‍යෂ්ටිය (4) අන්ත: ප්ලාස්මීය ජාලිකාව

8.පහත ප්‍රකාශවලින් බලය නිවැරදිව අර්ථ දැක්වෙන්නේකිනම් ප්‍රකාශයේද?
   (1) බලය සැමවිටම ඇදීමක් හෝ තල්ලු කිරීමකි.
   (2) බලය සැමවිටම ගුරුත්වය දෙසට ක්‍රියා කරයි.
   (3) අසංතුලිත බලයක් යෙදෙන තෙක් වස්තුව නිශ්චලව පවතී.
   (4) සමතුලිත බලයකින් වස්තුවක් ත්වරණය වේ.

9.පහත ඒවායින් ධ්වනියේ ලාක්ෂණියක් **නොවන්නේ** කුමක්ද?
   (1) තාරතාව (2)ධ්වනි ගුණය (3)විපුලතාව (4) කම්පනය

10. ලේවායක ගොඩගසා තිබූ ලුණු ස්ඵටික තිත්ත රසයෙන් යුක්ත බව අයෙක් පැවසූ හ.එයට හේතුව විය හැක්කේ කුමක්ද?
   (1) ලුණුවල $CaCO_3$ අන්තර්ගත වීම (2)ලුණුවල $CaSO_4$ අන්තර්ගත වීම
   (3) ලුණුවල $MgCl_2$අන්තර්ගත වීම (4) ලුණුවල NaClඅන්තර්ගත වීම

11.රූපයෙන් දැක්වෙන ඇටවුමෙන් පරීක්ෂා කිරීමට අරමුණු කරන්නේ ජීවීන්ගේ කුමන ජීව ක්‍රියාවලියද?




(1) වර්ධනය
(2) පෝෂණය
(3) බහිස්ස්‍රාවය
(4) ශ්වසනය

12.X නැමති අණුවක ස්කන්ධය 2.99 x 10 $^{-23}$ ග්‍රෑම්. පරමාණුක ස්කන්ධ ඒකකය 1.67 x 10 $^{-24}$ ග්‍රෑම් , X හි සාපේක්ෂ අණුක ස්කන්ධය දැක්වෙන නිවැරදි සම්බන්ධතාව කුමක් ද?

(1) $\frac{2.99 \times 10^{-23}}{1.66 \times 10^{-24}}$ (2) $\frac{1.66 \times 10^{-24}}{2.99 \times 10^{-23}}$

(3) $2.99 \times 10^{-23} + 1.66 \times 10^{-24}$ (4) $2.99 \times 10^{-23} - 1.66 \times 10^{-24}$

13. එක්තරා ද්‍රාවණයක සංයුතිය 2 $gdm^{-3}$ ලෙස දී ඇත.මෙහි සංයුතිය ප්‍රකාශ කර ඇත්තේ
(1) ස්කන්ධ භාගයක් ලෙස ය.
(2) පරිමා භාගයක් ලෙස ය.
(3) ස්කන්ධය හා පරිමාව අතර අනුපාතයක් ලෙස ය.
(4) ස්කන්ධය හා මවුල අතර අනුපාතයක් ලෙස ය.

14. පෘෂ්ඨ දෙකක් අතර ක්‍රියාත්මක වන ඝර්ෂණ බලය සම්බන්ධව ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
(A) චලනය වීමට මොහොතකට පෙර ක්‍රියාත්මක වන ඝර්ෂණ බලය ගතික ඝර්ෂණ බලය නම් වේ.
(B) ගතික ඝර්ෂණ බලය ස්ථිතික ඝර්ෂණ බලයට වඩා ඉහළ අගයක් ගනී.
(C)ස්පර්ශ පෘෂ්ඨ දෙකක් අතර ක්‍රියාත්මක වන උපරිම ඝර්ෂණ බලය සීමාකාරී ඝර්ෂණ බලයයි.
මෙම ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ
(1)A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) B හා C පමණි.

15. පහත කිරණ සටහන් වලින් අවධි කෝණය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1)



(2)



(3)



(4)



16.පහත දැක්වෙන්නේ අපෘෂ්ඨවංශීන් සතු ලක්ෂණ කිහිපයකි.
(A) ද්වි ප්‍රස්ථරික බව
(B) දේහය මතුපිට කයිටිනීය උච්චර්මයක් පැවතීම
(C) සන්ධි උපාංග පැවතීම
(D) ශ්ලේෂ්මලයෙන් තෙත් වූ දේහාවරණය

මෙම ලක්ෂණ අතරින් ආත්‍රපෝඩා වංශයට අයත් ලක්ෂණ වන්නේ,
(1) A හා B ය. (2) B හා Cය. (3) Cහා D ය. (4) A හා D ය.

17.ප්‍රභාසංස්ලේෂණය සඳහා $CO_2$අවශ්‍ය බව පරීක්ෂා කිරීමට කරන ලද ක්‍රියාකාරකමක පළමු පියවර පහත දැක්වේ.

**පියවර 1- පැළෑටියක් පැය 48 ක් අඳුරේ තැබීම**

මෙහිදී පැළෑටිය අඳුරේ තබන ලද්දේ
(1) හිරු එළිය ඇති විට $CO_2$ වල බලපෑම වැඩි නිසා ය.
(2) හිරු එළිය ඇති විට ජලයේ බලපෑම වැඩි නිසා ය.
(3) ශාක පත්‍රවල සෑදී තිබූ පිෂ්ඨය ශාක පත්‍රවලින් ඉවත් වන නිසා ය.
(4) හිරු එළිය නැති විට ශාක පත්‍ර වල කොළ පැහැය ඉවත්වන නිසා ය.

18. රූපයේ දැක්වෙන්නේ බාහිර බලයකින් තොරව මේස තලයක් මත නිශ්චලව ඇති ලී කුට්ටියකි. ඒ මත W හා R යන බල එකම ක්‍රියා රේඛාවක ප්‍රති විරුද්ධව ක්‍රියාත්මක වේ. එම බල අතර නිවැරදි සම්බන්ධය කුමක්ද?

(1)R>W (2)W > R

(3)R+W= 0 (4)W=R




19.පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) ඉහළ ද්‍රවාංකයක් සහිත ද්‍රව්‍ය කාමර උෂ්ණත්වයේදී වායු ලෙස පවතී.

(B) ඝන ද්‍රව්‍යයක් මුළුමනින් ම එහි ද්‍රවය බවට පත්වන තෙක් නියතව පවත්නා උෂ්ණත්වය එහි ද්‍රවාංකය නම් වේ.

(C)වායුවක් සම්පූර්ණයෙන් ම එහි ද්‍රවය බවට පත්වන තෙක් නියතව පවත්නා උෂ්ණත්වය එහි තාපාංකය වේ.

මේවායින් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ

(1) A පමණි (2) B පමණි (3)A හාB ය. (4) B හා C ය.

20.$CaCO_3$ කැට හා කුඩු 2g බැගින් වෙන වෙනම කිරා ගන්නා ලදී. ඒවා එක සමාන HClපරිමා සමඟ ප්‍රතික්‍රියා කරවන ලදී. ප්‍රතික්‍රියක සම්පූර්ණයෙන් නොපෙනී යාමට ගතවන කාලය වෙන වෙනම මැනගන්නා ලදී.




ඉහත ක්‍රියාකාරකම මඟින් ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාවය කෙරෙහි බලපාන කිනම් සාධකය පරීක්ෂා කෙරේද?

(1) ප්‍රතික්‍රියකවල භෞතික ස්වරූපය (2) ප්‍රතික්‍රියාව සිදුවන උෂ්ණත්වය

(3)ප්‍රතික්‍රියකවල සාන්ද්‍රණය (4) උත්ප්‍රේරක බලපෑම

21.භස්ම භාවිත කෙරෙන අවස්ථාවකට උදාහරණයකි.

(1) වානේ භාණ්ඩවල මල ඉවත් කිරීමේදී

(2) ඡායාරූප පටල නිපදවීමේදී

(3) ලුණු නිස්සාරණයේදී ලුණු ස්ඵටික ලබා ගැනීමේදී

(4) සීනි කර්මාන්තයේදී උක් පැණි සංශුද්ධ කිරීමේ දී

22. රෝහලක ප්‍රදර්ශනය කර තිබූ දැන්වීමක පහත උපදෙස් සටහන්ව තිබුණි.

- උණු කර නිවා ගත් ජලය පානය කරන්න.
- ජල මුද්‍රිත වැසිකිළි භාවිත කරන්න.
- මැස්සන්ට ඇතුළු විය නොහැකි ලෙස ආහාර වසා තබන්න.
- වැසිකිළි භාවිතයෙන් පසු දෑත් සබන් යොදා පිරිසිදු කරන්න.

මෙම උපදෙස් ලබා දී ඇත්තේ ආහාර ජීර්ණ පද්ධතිය ආශ්‍රිත කිනම් රෝගයෙන් වැළකීමටද?

(1) පාචනය (2) ගැස්ට්‍රයිටීස්

(3) ආහාරමාර්ගයේ පිළිකා (4) මලබද්ධය

23. පුෂ්පයක ජායාංගයට අයත් කොටස් රූපයේ දැක්වේ. පුෂ්පය ඵලයක් බවට පත්වීමේදී බීජ බවට පත්වන්නේ කුමන කොටසද?

(1) a (2)b

(3) c (4) d




24. AB යන සමාකාර දණ්ඩේX යනු මධ්‍ය ලක්ෂ්‍ය නොවේ.X ලක්ෂ්‍ය දෙපස දණ්ඩ සංතුලනය කර ඇත්තේ200g ලෝහ කුට්ටියක් හා පේර ගෙඩියක් එල්ලීමෙනි. පේර ගෙඩියේ බර විය හැක්කේ,

(1) N2 ය.

(2)N3 ය.

(3) 6N ය.

(4) 9 N ය.



25. පහත ප්‍රතික්‍රියා අධ්‍යයනය කරන්න.

(A) $CaCO_{3(S)} \xrightarrow[\Delta]{} CaO_{(S)} + CO_{2(g)}$

(B) $CaO_{(s)} + H_2O_{(l)} \xrightarrow[\Delta]{} Ca(OH)_{2(S)}$

(C) $Mg_{(S)} + HCl_{(a.q)} \xrightarrow[\Delta]{} MgCl_{2(a.q)} + H_{2(g)}$

මේවායින්

(1) A තාප දායක වන අතර B හා C තාප අවශෝෂක ය.
(2) A තාප අවශෝෂක වන අතර B හා C තාප දායක ය.
(3) A හා B තාප දායක වන අතර C තාප අවශෝෂක ය.
(4) A හා c තාප අවශෝෂක වන අතර B තාප දායක ය.

26. මෙහි දැක්වෙන්නේ විද්‍යුත් රසායනික කෝෂයකි. මෙහි යොදාගෙන ඇත්තේ යකඩ හා කොපර් ලෝහයන්ය. මෙහි කැතෝඩීය ප්‍රතික්‍රියාව දැක්වෙන පිලිතුර තෝරන්න.




(1) $H^+_{(aq)} + 2e \longrightarrow H_{2(g)}$
(2) $Fe_{(s)} \longrightarrow Fe^{2+}_{(aq)} + 2e$
(3) $Cu_{(s)} \longrightarrow Cu^{2+}_{(aq)} + 2e$
(4) $Fe_{(s)} + 2H^+_{(aq)} \longrightarrow Fe^{2+}_{(aq)} + H_{2(g)}$

27. ගෘහ විද්‍යුත් පරිපථයක උපාංග සවිකර ඇති ආකාරය ගැලීම් සටහනකින් පහත දක්වා ඇත.

සේවා රැහැන → [X] → විදුලි මීටරය → [Y] → බිම් කාන්දු පැන්නුම් ස්විචය

X හා Y නි වැරදිව නම් කර ඒවායේ කාර්යය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | X | X හි කාර්යය | Y | Y හි කාර්යය |
|---|---|---|---|---|
| 1 | පැන්නුම් ස්විචය | විදුලි සැර වැදීම වැළැක්වීම | විබෙදුම් පෙට්ටිය | විදුලිය බෙදා හැරීම |
| 2 | සේවා විලායකය | විදුලි මීටරයට ආරක්ෂාව සැලසීම | ප්‍රධාන ස්විචය | අළුත්වැඩියාවකදී පරිපථය විසන්ධි වීම |
| 3 | සේවා විලායකය | අළුත්වැඩියාවකදී පරිපථය විසන්ධි වීම | ප්‍රධාන ස්විචය | විදුලි මීටරයට ආරක්ෂාව සැලසීම |
| 4 | විබෙදුම් පෙට්ටිය | විදුලිය බෙදා හැරීම | විබෙදුම් පෙට්ටිය | විදුලි සැර වැදීම වැළැක්වීම |

28. මිනිසාගේ නයිට්‍රජනීය බහිස්‍රාවය සිදුවන ප්‍රධාන ඉන්ද්‍රීය හා බහිස්‍රාවී ද්‍රව්‍ය නිවැරදිව ගැළපී ඇති පිළිතුර තෝරන්න.

(1) වකුගඩු - යූරියා
(2) අක්මාව - යූරියා
(3) වකුගඩු - මුත්‍ර
(4) සම - දහඩිය

29. පහත දැක්වෙන්නේ තැලිසීමියාව රෝගය ප්‍රවේණිගත වන ආකාරය දැක්වෙන සටහනකි. මෙම සටහනට අනුව පළමු දරු පරම්පරාවේ තැලිසීමියා රෝගය පිළිබඳව නිවැරදි පිළිතුර වන්නේ

| | සමයුග්මක රෝගී | | විෂමයුග්මක වාහක | |
|---|---|---|---|---|
| දෙමාපිය පරම්පරාව | tt | | Tt | |
| ජන්මාණු | t | t | T | t |
| පළමු දරු පරම්පරාව | Tt | tt | Tt | tt |

(1) සියලුම දරුවන් රෝගීන් ය.
(2) සියලුම දරුවන් වාහක ය.
(3) රෝගී දරුවන් 50% ක් හා වාහක දරුවන් 50% කි.
(4) රෝගී දරුවන් 25% ක් හා වාහක දරුවන් 75% කි.

30. හෘත් ස්පන්දනයේදී කර්ණිකා කෝෂිකා ආකුංචය හා විස්තාරය සිදු වේ. හෘත් චක්‍රයක අවස්ථා නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

| | | | |
|---|---|---|---|
| (1) | කර්ණිකා විස්තාරය | කෝෂිකා විස්තාරය | කර්ණිකා කෝෂිකා විස්තාරය |
| (2) | කෝෂිකා ආකුංචය | කෝෂිකා ආකුංචය | කර්ණිකා කෝෂිකා විස්තාරය |
| (3) | කර්ණිකා විස්තාරය | කෝෂිකා ආකුංචය | කර්ණිකා කෝෂිකා ආකුංචය |
| (4) | කර්ණිකා ආකුංචය | කෝෂිකා විස්තාරය | කර්ණිකා කෝෂිකා ආකුංචය |

31. යකඩ හැන්දක් මත තඹ ලෝහය ආලේප කර ගැනීමට ශිෂ්‍යයකුට අවශ්‍ය විය. ඒ පිළිබඳව නිවැරදි පිළිතුර තෝරන්න.

| | ඇනෝඩය | කැතෝඩය | විද්‍යුත් විච්ඡේද්‍ය |
|---|---|---|---|
| (1) | තඹ | යකඩ හැන්ද | කොපර් සල්ෆේට් |
| (2) | යකඩ හැන්ද | තඹ | කොපර් සල්ෆේට් |
| (3) | යකඩ හැන්ද | තඹ | ෆෙරස් සල්ෆේට් |
| (4) | තඹ | යකඩ හැන්ද | ෆෙරස් සල්ෆේට් |

32. ඔබට පහත සඳහන් ලෝහ සපයා ඇත.

Zn,Mg,Cu,Al ,Ag

යකඩවල කැතෝඩීය ආරක්ෂාව සඳහා සුදුසු ලෝහ යුගල ඉහත ලෝහ අතුරින් කිනම් ඒවා ද ?

(1) Zn හා Mg (2) Zn හා Cu (3)Al හා Ag (4) Mg හා Cu

33.ද්‍රාව පීඩන ජැක්කුවේ ක්‍රියාව ආදර්ශනයට සකස් කළ ඇටවුමක් මෙහි දක්වා ඇත.A පිස්ටනය පතුලේ වර්ගඵලය 10 $cm^2$ කි. B පිස්ටනය පතුලේ වර්ගඵලය 200 $cm^2$ කි. 100 kg ස්කන්ධයෙන් යුත් වස්තුවක් එසැවීමට A පිස්ටනය මත යෙදිය යුතු අවම බලය කොපමණද?




(1) 10 N (2)20 N
(3) 50 N (4) 100 N

34. ජල විදුලි බලාගාරයක ටර්බයිනයක් මත පතිත වන ජල පහරේ ප්‍රවේගය 2 $ms^{-1}$ කි.ටර්බයිනයේ පෙති 5ක් ඇත. පෙත්තක් මත 5 kg ක සමාකාර ජල ස්කන්ධයක් පතිත වේ.එක් වටයක් භ්‍රමණය වන විට ට'බයිනයේ චාලක ශක්තිය දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) $\frac{4 \times 2 \quad \times 5 \text{ J}}{2}$ (2) $\frac{5 \times 2 \quad \times 5 \times 2 \text{ J}}{2}$ (3) $\frac{4 \times 4 \quad \times 2 \text{ J}}{2}$ (4) $\frac{4 \times 4 \quad \times 5 \text{ J}}{2}$

35.ශාක වල දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

(A) මුදුන් මුලක් නැත. (C) පත්‍ර ජාලාභ නාරටි වින්‍යාසයක් ගනී.
(B) ත්‍රි අංකී පුෂ්ප දරයි. (D) කඳ අතු බෙදී නැත.

මෙම ලක්ෂණවලින් ඒක බීජපත්‍රී ශාක හා ද්විබීජපත්‍රී ශාක පෙන්වන ලක්ෂණ පිළිවෙළින් ගැලපී ඇති පිළිතුර තෝරන්න.

(1) C හා D (2) Bහා A (3) Dහා C (4) B හා C

36. A,B හා C නම් වන ලෝහ 3ක් පිළිබඳ ව පහත දී ඇති තොරතුරු විමසා බලන්න.

A - ඔක්සිහරණයට ලක් කිරීමෙන් වෙන් කර ගනී.
B - වායුගෝලීය වාතය සමඟ වේගයෙන් ප්‍රතික්‍රියා කරයි.
C - වායුගෝලයේ දැවීමෙන් ඔක්සයිඩ සාදයි.

මෙම ලෝහ සක්‍රියතාව අඩුවන සේ පෙළ ගැස්වූ විට ලැබෙන ශ්‍රේණිය මින් කුමක්ද?

(1) A ,B,C (2) B,C,A (3) A,C,B (4) C,A,B

37. පහත දැක්වෙන්නේ බල්බ දෙකක් හා ප්‍රතිරෝධ දෙක බැගින් සම්බන්ධ කර ඇති පරිපථ සටහන් හතරකි. (බල්බ සියල්ල සර්වසම වන අතර ප්‍රතිරෝධකද සර්වසම වේ.)

a


b


c


d


බල්බවල දීප්තිය අඩුවන පිළිවෙලට අදාළ පිළිතුර කුමක් ද?

(1) d,c,b,a (2) a,b,c,d (3) d,c,a,b (4) a,b,d,c

38. පහත දැක්වෙන පරිපථ සටහන අනුව X හා Y සඳහා ගැලපෙන අගයන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.




(1) 2.6 V හා 13 Ω (2) 2.6 V හා 2 Ω (3) 0.5 V හා 10 Ω (4) 0.4 V හා 3 Ω

39.ආසියානු සංවර්ධන බැංකුව මඟින් 1997 වර්ෂයේදී කරන ලද පර්යේෂණ වාර්තාවක තොරතුරු පහත වගුවේ දැක්වේ.වායුගෝලයට $SO_2$ වායුව විමෝචනය වන ප්‍රතිශතයන් එහි දැක්වේ.

| | |
|---|---|
| ඉන්ධන දහනය | 4 % |
| කර්මාන්ත | 7 % |
| ගෘහස්ථ පරිභෝජනය | 11 % |
| බලශක්ති උත්පාදනය | 20 % |
| ප්‍රවාහනය | 40 % |

ඉහත තොරතුරු අනුව සැලසුම් කළයුතු පරිසර හිතකාමී ක්‍රියාකාරකමක් **නොවන්නේ**

1. බලශක්ති උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කිරීම
2. ප්‍රවාහනය සඳහා විදුලියෙන් ක්‍රියාකරන වාහන ප්‍රචලිත කිරීම
3. ඉන්ධනයක් ලෙස ගල් අඟුරු දහනය වැඩි කිරීම
4. වැඩි විදුලි ඉල්ලුමක් ඇති ආයතන සඳහා සූර්යය බලය භාවිත කිරීමට නීති පැනවීම

40.පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) අපද්‍රව්‍ය වර්ගීකරණය කර බැහැර කිරීම තුළින් කසළ කළමණාකරණය පහසු වේ.
(B) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස බැහැර නොකර සුරක්ෂිතව ගබඩා කිරීම තුළින් දීර්ඝකාලීනව පරිසරය ආරක්ෂා වේ.
(C) කෘමි හා වල්පැළෑටි පාලනයට හොඳම ක්‍රියාමාර්ග රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමයි.
(D) කෘෂි කර්මාන්තයේදී භාවිතා කළ සාම්ප්‍රදායික දැනුම යළිත් ප්‍රචලිත කිරීම තුළ මිනිසාට හිතකර පරිසරයක් නිර්මාණය කළ හැක.

මෙම ප්‍රකාශ අතුරින් තිරසර සංවර්ධනයට වඩා වැදගත් ප්‍රකාශ ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B, හාC ය. (2) A, CහාD (3) B, CහාD ය. (4) A, BහාDය.


ඉන්ටනෙට් සෙල්ලම
දිනක වෙිදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි